පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 10 (1 වාරය)

විෂය:- :- ගණිතය

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 3 )

# 06. ඝන වස්තු

- අවකාශයේ යම් ඉඩක් ගන්නා නියත හැඩයක් ඇති වස්තු, ඝන වස්තු ලෙස හැඳින්වේ.
- ඝන වස්තුවල මතුපිට, තල පෘෂ්ඨ කොටස්වලින් හෝ වක්‍ර පෘෂ්ඨ කොටස්වලින් හෝ සමන්විත වේ.

## 6.5 ඝන වස්තු සඳහා ඔයිලර් සම්බන්ධතාව

- ස්විස් ජාතික ඔයිලර් නම් ගණිතඥයා විසින් ඝන වස්තුවක දාර, ශීර් ෂ, මුහුණත් අතර සම්බන්ධතාවයක් ඉදිරිපත් කර ඇත. මෙය ඔහුගේ නමින් “ඔයිලර් සම්බන්ධතාවය” ලෙස හැඳින්වේ.

**ඔයිලර් සම්බන්ධතාව**
සරල දාර සහිත ඝන වස්තුවක මුහුණත් සංඛ්‍යාවේ සහ ශීර්ෂ සංඛ්‍යාවේ එකතුව දාර සංඛ්‍යාවට වඩා දෙකකින් වැඩි ය.

එම සම්බන්ධතාව මේ ආකාරයට ද ලියා දැක්විය හැකි ය.

ශීර්ෂ ගණන + මුහුණත් ගණන = දාර ගණන + 2

$$V + F = E + 2$$

- ඔබ පෙර සතියේ නිර් මාණය කළ ඝනවස්තු නිරීක්ෂණය කරමින් ක්‍රියාකාරකම 4 කරන්න.
- 6.2 අභ්‍යාසය කරන්න.

## 6.6 ප්ලේටෝ කැට

- 01. මුහුණත් සියල්ල එක සමාන වූ ද,

  02. එම මුහුණත් එකම වර් ගයේ සවිධි බහු අස්‍ර වූ ද,

  03. සෑම ශීර් ෂයකදීම හමු වන මුහුණත් ගණන සමාන වූ ද

  ඝන වස්තු ප්ලේටෝ කැට (Platonic Solids) ලෙස හැඳින්වේ.

- මෙවැනි ඝන වස්තු 5ක් පමණක් ඇත. ඒවා පහත දැක්වේ.



සවිධි චතුස්තලය　ඝනකය　සවිධි අෂ්ටතලය　සවිධි ද්වාදසතලය　සවිධි විංසතිතලය

- 6.3 අභ්‍යාසය කරන්න.